| සුවුවෙන් පෙරට<br>e ඉගෙනුම් පියස<br>මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය | | |
|---|---|---|
| වාරය - III | | |
| ශ්‍රේණිය : 13 | විෂයය : සිංහල | පාඩම : පුරාතන පද්‍ය - ගුත්තිල කාව්‍ය |

# ගුත්තිලය - 13 ශ්‍රේණිය

ස්වයං ඉගෙනුම් අත්වැල....

## ගුත්තිල කාව්‍ය හා එහි පසුබිම

ගුත්තිල කාව්‍ය රචනා කරන ලද්දේ වෑත්තෑවේ හිමියන් විසිනි. ඒ උන්වහන්සේට ආරාධනා කරනු ලබන්නේ සලවත ජයපාල මැතිදුන් විසිනි. වෑත්තෑවේ හිමියන් තොටගමුවේ විජයබා පිරිවෙන්පති ෂඩ් භාෂා පරමේෂ්වර තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් යටතේ සිප්සතර හැදෑරූ ශිෂ්‍යයෙකු වන අතර ගුරු ද්‍රෝහී වීමේ විපාක තම දන්නා බව ආචාර්යපදයන්ට හඟවනු පිණිස ගුත්තිල කාව්‍ය රචනා කළ බව ජනප්‍රවාදයේ දැක්වේ.

සිංහල පද්‍ය සහිත්‍යයේ ස්වර්ණමය යුගය සේ හැඳින්වෙන කෝට්ටේ යුගයේදී ගුත්තිල ජාතකය පදනම්ව පද්‍ය 511 න් සමන්විත මෙම කාව්‍ය ග්‍රන්ථය ලියවී ඇත. සවන පැරකුම්බාවන් විසින් අවසන් වරට ලංකාව එක්සේසත් කිරීමෙන් පසුව උදාවූ සාමකාමී හා සමෘද්ධිමත් සමාජ පසුබිමත් රාජානුග්‍රහය ලැබීමත් තත්කාලීන සාහිත්‍යෝන්නතියට හේතු වූ බව පෙනේ.

## කෝට්ටේ යුගයේ පද්‍ය සාහිත්‍යයේ විවිධත්වය

- පංච මහා සංදේශ - සැළලිහිණි සංදේශය (තොටගමුවේ ශ්‍රී රාහුල හිමි)
  - පරෙවි සංදේශය (තොටගමුවේ ශ්‍රී රාහුල හිමි)
  - ගිරා සංදේශය (කර්තෘ අවිනිශ්චිතය)
  - හංස සංදේශය ( විදාගම මෛත්‍රී හිමි)
  - කෝකිල සංදේශය (ඉරුගල්කුලතිලක හිමි)

- මහා කාව්‍ය - කාව්‍යශේඛරය (තොටගමුවේ ශ්‍රී රාහුල හිමි)
- ඛණ්ඩ කාව්‍ය - ගුත්තිලය (වෑත්තෑවේ හිමි)
- උපදේශ කාව්‍ය - ලෝවැඩ සගරාව (විදාගම මෛත්‍රී හිමි)
- භක්ති කාව්‍ය - බුදුගුණ අලංකාරය (විදාගම මෛත්‍රී හිමි)
- ප්‍රශස්ති කාව්‍ය - පැරකුම්බා සිරිත
- ශතක කාව්‍ය - එළු සිලෝ ශතකය
- ප්‍රහේලිකා කාව්‍ය - දහම්ගැට මාලාව

## විචාරාත්මක පිළිතුරු සඳහා ප්‍රවේශයක්.....

- ❖ ගුත්තිල කාව්‍යයේ අලංකාර භාවිතය.
  (කරුණුවලට අදාල නිදසුන් කවිය බැගින් තෝරා ලියන්න.)

- ❖ ශබ්දාලංකාර භාවිතය.
  1. තාලය, ලය මෙන්ම විරිත් භාවිතය
     - ගී විරිත
     - පෙද විරිත
     - සවිසිමත් විරිත
     - යොන්මත්වැල විරිත
  2. එසේම එකම විරිත තුළ වුවද, බසෙහි රිද්මය වෙනස් කරමින් ශබ්ද රසය තීව්‍ර කිරීම.
     (උදේනිපුර සැණකෙළි වැනුම)
  3. අනුප්‍රාසවත් පද සංඝටනා යෙදීම.
  4. එළිසමය හා එළිවැට යොදාගැනීම.

- ❖ අර්ථාලංකාර භාවිතය.
  1. ඖචිත්‍යයෙන් යුතු නව්‍ය සංකල්පනා ජනනය වන උපමා භාවිතය.
  2. විචිත්‍රවත් වූ රූපක භාවිතය.
  3. ස්වභාවෝක්ති අලංකාර භාවිතය.
  4. අතිශයෝක්ති අලංකාර භාවිතය.

❖ ගුත්තිල කතු හිමියන්ගේ ප්‍රතිභාපූර්ණ කවීත්වය.

- අලංකාර භාවිතයේ පවතින උත්කෘෂ්ටභාවය.
- නවතාවයෙන් හා ඖචිත්‍යයෙන් යුතු සංකල්ප රූප නිර්මාණය.
- ශබ්දාර්ථ සුසංයෝජනය.
- විවිධ විරිත් භාවිතය මෙන්ම එකම විරිත තුළ රිද්මය වෙනස් කිරීම.
- වර්ණනා බාහුල්‍යයෙන් තොර සංක්ෂිප්ත රීතිය.
- සංකීර්ණ ජීවමාන යථාර්ථවාදී චරිත නිරූපණ ශක්‍යතා.
- මානව දයාවෙන් ප්‍රේරිත කාව්‍යමය දෘෂ්ටිය.

❖ ගුත්තිල කාව්‍යයේ බස් වහර

- සරල, සුගම, සුලලිත බස් වහර
- වියත් වහර මෙන්ම ජනවහරෙහි ද සංකලනයෙන් සුසැදි මනහර බසක් භාවිතය.
- වියත් වහර හා ජනවහර මිශ්‍ර කිරීමෙන් අර්ථ සුගම්‍යතාව මතු කිරීමේ ශෛලිය.
- අලංකාරයන්ගෙන් විචිත්‍රවත් බස් වහර.
- සංකල්පරූපාත්මක බස පරිහරණය.

## විචාර ලිවීමේ ශක්‍යතා

ඉහත තොරතුරු ඇසුරින් ගොඩනැගෙන විචාර ප්‍රශ්නාවලිය.

1. "ශබ්දාර්ථ සුසංයෝජනයෙන් රසාලිප්ත වූ විශිෂ්ටතම කාව්‍යයක් වශයෙන් ගුත්තිල කාව්‍ය අගය කළ හැකිය." නිදසුන් දක්වමින් විමසන්න.

2. වෑත්තෑවේ හිමියන්ගේ වර්ණනා චාතුර්යයේ අපූර්වත්වය ඉස්මතු වන්නේ අලංකාර භාවිතයේ විශිෂ්ටත්වය මතය. යන අදහස නිදසුන් ඇසුරින් අගය කරන්න.

3. 1. කෝට්ටේ යුගය පද්‍ය සාහිත්‍යයේ ස්වර්නමය අවධිය ලෙස සැලකීම සහේතුකව විමසන්න.

   2. ගුත්තිලයේ විරිත් භාවිතයේ සුවිශේෂතා වර්ණනා තුනක් ඇසුරින් නිදසුන් දක්වමින් විමසන්න.

4. 1. වියත් කතුවරුන්ගේ පද්‍ය කෘති ඇසුරින් කෝට්ටේ යුගයේ පද්‍ය සාහිත්‍යයේ විවිධාංගීකරණය අගයන්න.

   2. "සකු කවි සමයට අනුකාරක නොවී ස්වීයත්වය විදහා දැක්වෙන අයුරින් ගුත්තිලයේ බස පරිහරණය ප්‍රශස්තය." නිදසුන් සහිතව විමසන්න.

5. ඛණ්ඩ කාව්‍යයක් ලෙසින් සම්භාවනාවට පාත්‍රවන ගුත්තිල කාව්‍යය වෑත්තෑවේ හිමියන්ගේ ප්‍රතිභාවේ සුපුල් ඵලයයි. නියමිත වර්ණනා ඇසුරින් නිදසුන් දක්වමින් විමර්ශනය කරන්න.

P.A. ඉරේෂා ගයානී මිය,
කලා අංශය
ඩී.එස්. සේනානායක ජාතික පාසල, මීරිගම.